# ලිංගික සංක්‍රාන්තිය සම්බන්ධ ව අතත්‍ය සන්නිවේදනයන් පැවැත්වීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(තෝරාගත් යූ ටියුබ් වැඩසටහන් දෙකක් ඔස්සේ)

*ඩී.ජී. නිපුනි හංසිමා ගමගේ [1]*

මෑත කාලයේ දී සැලකිය යුතු අවධානයක් දිනාගත් මාතෘකාවක් වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ සංක්‍රාන්තික ලිංගිකත්වයයි. සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන්, උපතේ දී ඔවුන්ට පවරා ඇති ලිංගිකත්වයට වඩා වෙනස් ලිංගිකයන් ලෙස හඳුනාගෙන දිගු කලක් තිස්සේ වෙනස් ලෙස සැලකීමට ලක් ව ඇත. අතත්‍ය සන්නිවේදනය සංක්‍රාන්තික ලිංගික ප්‍රජාවට තොරතුරු බෙදා ගැනීමට, දැනුවත් කිරීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට වැදගත් මෙවලමක් ලෙස මතු වී ඇත. ලිංගික සංක්‍රාන්තිය පිළිබඳ අතත්‍ය සංවාදල පුද්ගලයන්ට ඔවුන්ගේ භූගෝලීය පිහිටීම නො සලකා අර්ථවත් සාකච්ඡාවල නිරත වීමට වේදිකා සපයයි. වීඩියෝ ඇමතුම්, කතාබස් සංසද සහ සබැඳි ආධාරක කණ්ඩායම් වැනි අතත්‍ය මාධ්‍ය හරහා පුද්ගලයන්ට ලිංගික සංක්‍රාන්තික ප්‍රජාව වෙත සම්බන්ධ වීමට, ඉගනීමට සහ ප්‍රවර්ධනය කිරීමට හැකි ය. නව තාක්ෂණය තුළින් විනිවිද යමින් සාකච්ඡා වන ලිංගික සංක්‍රාන්තිය පිළිබඳ අතත්‍ය සංවාද පිළිබඳ සොයා යමින් ලිංගික සංක්‍රාන්තිකයන් මුහුණ දෙනු ලබන සැබෑ අභියෝග සහ ගැටලුකාරී තත්ත්වයන් කවරක් ද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ තේමාවයි. අධ්‍යනයේ ගැටලුව වන්නේ නූතන ශ්‍රී ලාංකීය සමාජය තුළ ලිංගික සංක්‍රාන්තිකයන් නිරූපණය වන ආකාරයයි. අධ්‍යනයේ විෂය පථය ලෙස යූ ටියුබ් මාධ්‍යයේ ලිංගික සංක්‍රාන්තිකයන් පිළිබඳ අතත්‍ය සන්නිවේදන වැඩසටහන් දෙකක් අධ්‍යනයේ මායිම් ලෙස ගෙන ඇත. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය හරහා සිදු කෙරෙන මේ අධ්‍යයනය සඳහා වැඩසටහන් දෙකේ  දෙබස්, සංයුතිය සහ රාමු විශ්ලේෂණය සිදු කෙරේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ  ලිංගික සංක්‍රාන්තියට ලක් වන පුද්ගලයන් සමාජීය වසයෙන් මුහුණ දෙනු ලබන ගැටලුකාරී තත්ත්වයන් ඉස්මතු කිරීමත්, සාමාජීය වසයෙන් ලිංගික සංක්‍රාන්තිකයන් පිළිබඳ පවත්නා සෘණාත්මක මතවාදයන් තුරන් කිරීමයි. මෙම පර්යේෂණය ඔස්සේ සංක්‍රාන්තික ලිංගිකත්වය යනු මානසික රෝගී තත්ත්වයක් නො ව ජෛව විද්‍යාත්මක පදනමක් සහිත සංසිද්ධියක් බවට සනාථ වනු ලැබේ. ඒ අනුව මේ වැඩසටහන් ද්විත්වය අධ්‍යයනය කිරීමේ දී ලිංගික සංක්‍රාන්තිකයන් ශ්‍රී ලංකාව තුළ සාමාජීය වසයෙන් විශාල අසාධාරණයන්ට ලක් ව ඇති ආකාරය හඳුනාගත හැකි විය. ලිංගික සංක්‍රාන්තිකයන් පිළිබඳ අතත්‍ය සන්නිවේදනය හරහා සාමාජීය වසයෙන් පවත්නා සෘණාත්මක  මතයන් තුරන් කොට ධනාත්මක මතයන් ගොඩ නැංවීමට හැකි ආකාරය අනාවරණය වීය. මේ හරහා ශ්‍රී ලංකාව තුළ සාමාජීය වසයෙන් ලිංගික සංක්‍රාන්තිකයන්ට සිදු වන අසාධාරණයන් වලක්වා ගත හැකි වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** ලිංගිකත්වය, සංක්‍රාන්තිකයන්, ශ්‍රී ලාංකීය, අතත්‍ය සන්නිවේදනය, වැඩසටහන්

[1] මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. dnipunihansima99@gmail.com